**ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය - 2017.**

---

ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා සාර්ක් සංවර්ධන අරමුදල අතර 2014 දෙසැම්බර් 17 දින එළඹි ව්‍යාපෘති මූල්‍ය ගිවිසුමේ 3.3 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘති මූල්‍ය ගිවිසුම අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල ජලය සහ පරිසර පද්ධති යටතේ යැපෙන ග්‍රාමීය ප්‍රජාවගේ ග්‍රාමීය ජන ජීවිතයේ ජීවන තත්ත්වය සහ චිරස්ථායී සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ මඩකලපුව හා මොනරාගල දිස්ත්‍රික්කවල ගම්මාන 09 කට අයත් ජල පෝෂක සහ වාරිමාර්ග පද්ධති යටතේ ජීවත්වන ප්‍රතිලාභී පවුල් 2800 ක ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො මිලියන 0.94 කට සමාන රු.මිලියන 119 ක් වූ අතර එය මූල්‍යායනය කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදල එකඟ වී තිබුණි.මෙම ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 17 දින ආරම්භ කළ අතර 2017 දෙසැම්බර් 16 දිනට නිම කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවත් 2018 දෙසැම්බර් 16 දින දක්වා ව්‍යාපෘතිය දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදානය කරනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානය යටතේ මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදානය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදානය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණේද යන බව හා

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා ආයෝජනය කර තිබුණු බව සහ

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව,

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියක මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාස 03 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවත් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2018 නොවැම්බර් 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යයසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළ මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදන සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ වටිනාකම | | අයවැයගත ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන |
| සාර්ක් සංවර්ධන අරමුදල | 0.94 | 141 | 86 | 0.40 | 59.90 | 0.67 | 101.61 |
| | **0.94** | **141** | **86** | **0.40** | **59.90** | **0.67** | **101.61** |

### 3.2 භෞතික ප්‍රගතිය

වැඩ සැලැස්මට අනුව මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කවල ගම් 09 ක ජල පෝෂක කළමනාකරණය ශක්තිමත් කිරීම, ඉඩම් භාවිතයන් සැලසුම් කිරීම, ජලය ආශ්‍රිතව ඇතිවන ලෙඩ රෝග අඩු කිරීම, තාක්ෂණය වැඩි දියුණු කිරීම මගින් සනිපාරක්ෂාව සහ සෞඛ්‍ය පහසුකම් වල තත්ත්වය තහවුරු කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් සෞඛ්‍ය තත්ත්වය තහවුරු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂා කරන ලදි .

එහෙත් මඩකලපුව දිස්ත්‍රික්කයේ වාහරේ, තොප්පිගල හා කලවංචිකුඩිද මොණරාගල දිස්ත්‍රික්කයේ සෙල්ලකතරගම, කහකුරුල්ලන් පැලැස්ස, කිඹුල්කෙම සහ කඳසුරිඳුගම යන ගම් 07 ක් පමණක් එම අරමුණු සඳහා තෝරාගනු ලැබූ අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ මාවට්ටුවාන් හා ආන්ඩන්කුලම් වැව් ප්‍රතිසංස්කරණය හා තෙතාතිච් බැම්ම ඉදි කිරීම පසුගිය වර්ෂය අවසානය වන විට නිම කර තිබුණි. තවද මොනරාගල දිස්ත්‍රික්කයේ ගෙරිකටුව වැව සහ කුකුල්කටුව වැව 2017 නොවැම්බර් 17 දින හා 2016 සැප්තැම්බර් 08 දින පිළිවෙලින් නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ යෝග්‍ය කණ්ඩායම් පුහුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම් ගොඩනැංවීම හා නවීකරණය කිරීම, චර්යාත්මක වෙනස්වීම් සඳහා අධ්‍යාපනික තොරතුරු සන්නිවේදනය දියුණු කිරීම හා සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යයනය කිරීම යනාදී ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පාලනය.**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිපැලැස්ස වැව ප්‍රතිසංස්කරණය සංවිධාන සතු තාක්ෂණික හා මූල්‍ය හැකියාව පිළිබඳ සැලකිලිමත් නොවී ගොවි සංවිධාන 02 කට 2017 ජනවාරි 19 දින රු. මිලියන 11.51 ක ඇස්තමේන්තු මුදලකට භාර දී තිබූ අතර 2017 ජූලි වන විට වැවේ කටයුතු කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය අපහසුතාවයන් මත නතර කර තිබුණි. තවද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විරෝධතා හමුවේ මීටර් 450 ක දිග වැව් බැම්මේ ඉදි කිරීම තාවකාලිකව නවත්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂා කළ පරිදි අක්කර 200 ක කුඹුරු වලට අඛණ්ඩව ජලය සැපයීම සඳහා වැව ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

**(ආ)** මොනරාගල රු. මිලියන 1.91 ක වියදමකින් ඉදිකර රු. මිලියන 1.06 ක වටිනාකමකින් යුතු අදාල උපකරණද සහිතව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට 2017 නොවැම්බර් 07 දින භාරදෙනු ලැබූ පාංශු පරීක්ෂණාගාරය පාංශු දැනුම සහිත නිලධාරීන් පත්කර නොතිබීම හේතුවෙන් 2018 ඔක්තෝබර් 31 දින වන විට ද අකර්මන්‍යව පැවතුණි.